සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | පැය එකයි |
|---|---|---|

නම / විභාග අංකය :- ..................................................................................................................

✶ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
✶ 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

01. අශ්ව හිස සහ මිනිසා දැක්වෙන මූර්තිය පිහිටා ඇති ස්ථානය වන්නේ,
1. රුවන්වැලි සෑය
2. ඉසුරුමුණිය
3. ජේතවන දාගැබ
4. අභයගිරිය

02. ගල්ලෙන්වල කටාරම අසල ලියූ ලිපි හඳුන්වා ඇත්තේ,
1. ගිරි ලිපි
2. පුවරු ලිපි
3. ටැම් ලිපි
4. ලෙන් ලිපි

03. ශ්‍රී ලංකාව පිළිබඳ සඳහන් දකුණු ඉන්දියානු ග්‍රන්ථයක් නොවන්නේ,
1. කෙලාය මාලෙ
2. සීලප්පදිකාරම්
3. පදිර්රුපත්තු
4. මණිමේකලෛයි

04. පූර්ව ඓතිහාසික යුගයේ කාන්තාවන් තම රූ සපුව කෙරෙහි උනන්දුවක් දැක් වූ බවට සාක්ෂියක් වන්නේ,
1. සකපෝරුව භාවිතා කිරීම
2. දඩයම් කල සතුන්ගේ ඇට කැබලි
3. උඩරංචාමඩම නිවසින් මැටි පබළු හමුවීම
4. ලම්බාකාර බිත්ති සහිත වරිච්චි නිවසක නටඹුන්

05. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් නිලධාරීන් "X" තීරුවේ ද එම නිලධාරීන් අතීතයේ හැඳින්වූ නාමයන් "Y" තීරුවේ ද දක්වා ඇත. ඒවා නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| i. නගර පරිපාලක<br>ii. වෙළෙඳ කටයුතු භාර ප්‍රධානී<br>iii. කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි<br>iv. භාණ්ඩාගාරික | A - පනඅදෙක<br>B - බතගු<br>C - නගරගුතික<br>D - රූප අදෙක<br>E - බඩගරික |

1. ECDB
2. CADE
3. CABE
4. BCDA

06. පහත කරුණු හා සම්බන්ධ මෙරට රාජ්‍ය පාලකයා කවුරුන් ද?

- පරුමකවරුන්ගේ සහායෙන් රට තුල මධ්‍යගත පාලනයක් ඇති කිරීම.
- තම ප්‍රතිමල්ලවයාට ගෞරවනීය අවමංගල උත්සවයක් පැවැත් වීම.
- ප්‍රථම වරට ලක්දිව එක්සේසත් කිරීම.

1. මහා විජයබාහු
2. ධාතුසේන රජු
3. වසඹ රජු
4. දුටුගැමුණු රජු

07. ක්‍රි.පූ. දෙවන සියවසට අයත් සෙල්ලිපියක "අඩික" නම් නිලධාරියෙකු සඳහන් වේ. ඔහුට අයත් කාර්යයභාරය වූයේ,
1. ඇළ මාර්ග ඉදිකර වීම
2. මාර්ග ඉදිකර වීම
3. වැව් තැනවීම
4. ජල පොකුණු ඉදි කිරීම

08. දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරවන ලද්දේ මෙම වරායෙනි,
1. දඹකොල පටුන 2. ලංකා පටුන 3. මාතොට 4. දේවනගර

09. ලාහුගල පිහිටි නිල්ගිරි සෑය අසලින් සොයාගත් සෙල්ලිපියේ සඳහන් රැජිණ වන්නේ,
1. ලීලාවතී රැජිණ 2. කල්‍යාණවතී රැජිණ
3. අනුලා රැජිණ 4. චූලසීවලීදේවී රැජිණ

10. මෙරට පුරාණ කාලයේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද වන්නේ,
1. මතරමපිබක 2. දකපති 3. බොජකපති 4. ගෘහදණ්ඩ

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 11 හා 12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - මහා වැව් ඉදි කර වීමේ ආරම්භකයා
B - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම
C - රට පළාත් වලට බෙදා පරිපාලනය විධිමත් කිරීම
D - දළඳ මාලිගයේ ආරක්‍ෂාව වෛලයික්කාර හමුදාවට බාර දීම
E - අභයගිරි දාගැබ ඉදිකර වීම

11. වසභ රාජ්‍ය සමයට අයත් සිදුවීම වන්නේ,
1. A හා C 2. A හා D 3. B හා C 4. C හා E

12. වලගම්බා රාජ්‍ය සමයට අයත් සිදුවීම වන්නේ,
1. A හා C 2. B හා E 3. C හා E 4. B හා D

13. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්නම හේතුව වන්නේ,
1. ආර්ථික පරිහානිය
2. කාලිංග හා පාණ්ඩ්‍ය වංශික බල අරගලය
3. කාලිංග මාඝගේ ආක්‍රමණය
4. දුර්වල පාලකයන් බලයට පත් වීම

14. මහනුවර රජධානියේ ආරම්භක රාජ්‍ය පාලකයා වූයේ,
1. පළමුවන විමලධර්මසූරිය රජු 2. දෙවන රාජසිංහ රජු
3. සේනාසම්මත වික්‍රමබාහු රජු 4. කරලියද්දෙ බණ්ඩාර රජු

15. උඩරට රාජධානි සමයේ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් හැඳින්වූයේ,
1. නින්දගම් 2. ගබඩාගම් 3. දේවාලගම් 4. පරවේණිගම්

16. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගත්තේ,
1. මයිකල් සර්වෙස් 2. වෛද්‍ය පැරසල්සස්
3. ගැලීලියෝ ගැලිලි 4. විලියම් හාවේ

17. පහත සඳහන් ලෝ ප්‍රකට නිර්මාණ බිහිකල කලාකරුවා වූයේ,
- පියෙටා ප්‍රතිමාව • අවසාන විනිශ්චය චිත්‍රය • ලොරෙන්සෝ මෙඩිසිගේ ප්‍රතිමාව

1. මයිකල් ආන්ජිලෝ 2. ලියනාඩෝ ඩාවින්චි
3. රෆායල් 4. මැසෙක්ෂියෝ

18. ආසියාවට පැමිණි ලන්දේසීන් පෙරදිග මූලස්ථානය පිහිටුවා ගත්තේ,
1. ගෝව 2. මදුරාසිය 3. බතාවිය 4. පොන්ඩිචේරි

19. පෘතුගීසින් හා උඩරට රාජ්‍ය අතර ඇති වූ සටන් සහ ඊට නායකත්වය දුන් පෘතුග්‍රීසි සෙන්පතිවරුන් "X" හා "Y" තීරු මගින් නිවැරදිව ගලපන්න.

| X | Y |
|---|---|
| i. දන්තුරේ<br>ii. බලන<br>iii. රන්දෙණිවල<br>iv. ගන්නෝරුව | A - දියෝගෝ ද මේලෝ<br>B - පේරෝ ලෝපෙස් ද සූසා<br>C - දොන් ජෙරනිමෝ ද අසවේදු<br>D - කොන්ස්තන්තීනු ද සා |

1. CBAD 2. CABD 3. BDCA 4. BCDA

20. ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසීන් ලංකාවේ උඩරට ප්‍රදේශ අල්ලා ගන්නා විට සිටි රජතුමා වූයේ,
1. දෙවන රාජසිංහ රජු
2. රාජාධිරාජසිංහ රජු
3. ශ්‍රී විජය රාජසිංහ රජු
4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

21. දහඅටවන සියවස අග භාගයේ දී කාර්මික විප්ලවය ආරම්භ වූ රට වූයේ,
1. ප්‍රංශය
2. බ්‍රිතාන්‍යය
3. පෘතුගාලය
4. ඉතාලිය

22. පහත සඳහන් "X" හා "Y" තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| i. ගුග්ලි මාර්කෝනි<br>ii. සැමුවෙල් මෝස්<br>iii. හෙන්රි බෙල්<br>iv. ජෝර්ජ් ස්ටීවන්සන් | A - දුම් නැව<br>B - මෝටර් රථය<br>C - දුම්රිය එන්ජිම<br>D - විදුලි පණිවිඩ ක්‍රමය<br>E - ගුවන් විදුලි යන්ත්‍රය |

1. EDAC
2. DBEA
3. EBAC
4. DCAB

23. ධනවාදය විග්‍රහ කරමින් රාජ්‍ය නිර්බාධවාදය නම් සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,
1. මැකියාවෙලි
2. අයින්ස්ටයින්
3. ඇඩම් ස්මිත්
4. ජොහැන්නස් ගුටන්බර්ග්

24. අශ්වයන් බඳින ලද නගුල් වලින් පේළියට වැපිරීමේ ක්‍රමය හඳුන්වා දුන්නේ,
1. රොබට් බැක්වෙල්
2. ඩෙම්ලර්
3. රොබට් පුල්ටන්
4. ජෙන් රෝටල්

25. ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍ය අවධානය යොමු වීමට බලපෑ සාධකයක් නොවූයේ,
1. ශ්‍රී ලංකාවෙන් වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබාගත හැකි වීම
2. ඉන්දියාවේ මූගල් පාලනය දුර්වල කිරීමට හැකි වීම
3. ඉන්දියානු සාගරයේ නාවික කටයුතු හැසිර වීමට පහසු වීම
4. ත්‍රිකුණාමලය වරායේ ආරක්ෂිත ව නැව් නවතා තැබිය හැකි වීම

26. ඉංග්‍රීසීන් විසින් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කල ප්‍රථම ආණ්ඩුකාරවරයා වූයේ,
1. ෆෙඩ්රික් නෝත් ය.
2. රොබට් බ්‍රවුන්රිග් ය.
3. හෙන්රි වෝඩ් ය.
4. එඩ්වඩ් බාන්ස් ය.

27. වර්ෂ 1848 දෙවන නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ,
1. මහනුවර
2. වෙල්ලස්ස
3. මාතලේ
4. කුරුණෑගල

28. ඉංග්‍රීසි පාලනය සමයේ උඩරට වැසියන්ගේ පාරම්පරික ඉඩම් අහිමි වීමට බලපෑ පනත වූයේ,
1. පොල් ගස් බදුපනත ය.
2. වෙළඳාම හා සම්බන්ධ බදු පනත ය.
3. මුද්දර පනත ය.
4. මුඩු ඉඩම් පනත ය.

29. 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දැක්වේ. ඉන් නොගැලපෙන යුගලය වන්නේ,
1. මහා බෝධි සමාගම - අනගාරික ධර්මපාල තුමා
2. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන - පූජ්‍ය රත්මලානේ ධම්මාලෝක හිමි
3. කොළඹ සහිරා විද්‍යාලය - සිද්ධි ලෙබ්බේ මහතා
4. උදයභානු පුවත්පත - ආරුමුග නාවලර් තුමා

30. අනුරාධපුරයේ බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමට පුරෝගාමී වූයේ,
1. ඩී.බී.ජයතිලක මහතා ය.
2. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය.
3. පියදාස සිරිසේන මහතා ය.
4. ආතර් වී. දියෙස් මහතා ය.

31. "X" හා "Y" තීරු ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| i. පියදාස සිරිසේන මහතා<br>ii. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි<br>iii. අනගාරික ධර්මපාල තුමා<br>iv. ටී.බී.ජායා මහතා | A - කොළඹ සහිරා විද්‍යාලය<br>B - සිංහල බෞද්ධයා පුවත්පත<br>C - ශිවන්ගල විද්‍යාලය<br>D - පංචමහා වාදය<br>E - සිංහල නවකතා |

1. DACE 2. EBDA 3. EDBA 4. CEBA

32. ක්‍රි.ව. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයක් නොවන්නේ,
1. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
2. රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
3. දිවයින පළාත් පහකට බෙදීම
4. උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම

33. ශ්‍රී ලාංකිකයන්ට මුල් වරට සර්වජන ඡන්ද බලය හිමි වූ ආණ්ඩුක්‍රමය වූයේ,
1. කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමය 2. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය
3. කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය 4. මැනිං ආණ්ඩු ක්‍රමය

34. වර්ෂ 1919 ද ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ,
1. ඩී.බී.ජයතිලක මහතා 2. පොන්නම්බලම් රාමනාදන් මහතා
3. පොන්නම්බලම් අරුණාචලම් මහතා 4. ඩී.එස්.සේනානායක මහතා

35. වර්ෂ 1908 දී ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බවට විධිමත් පෙත්සමක් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කරන ලද්දේ,
1. එන්.එම්.පෙරේරා මහතා 2. කොල්වින් ආර්. ද සිල්වා මහතා
3. පිලිප් ගුණවර්ධන මහතා 4. ජේම්ස් පීරිස් මහතා

36. හෙමිලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර රෝගය නිසා පරිහානියට පත් වූ වැවිලි බෝගය වූයේ,
1. තේ 2. කෝපි 3. රබර් 4. පොල්

37. මෙරට නාගරික කම්කරුවන් තම අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා සිදු කල වැඩ වර්ජනයක් නොවන්නේ,
1. අතිකාල දීමනා ලබා ගැනීමේ වැඩ වර්ජනය
2. මුද්‍රණ කම්කරු වැඩ වර්ජනය
3. කොළඹ රෙදි සෝදන්නන්ගේ වැඩ වර්ජනය
4. කරත්තකරුවන්ගේ වැඩ වර්ජනය

38. මෙරට වතු කම්කරුවන් සඳහා වෘත්තීය සංගම් පිහිටු වීමට නායකත්වය සපයන ලද්දේ,
1. ඒ.ඊ.ගුණසිංහ මහතා 2. සී.වන්ද්‍රසේකරම් මහතා
3. නඩේස අයියර් මහතා 4. ආරුමුගම් තොන්ඩමන් මහතා

39. මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවන ලද්දේ,
1. පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි 2. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
3. පූජ්‍ය පොතුවිල ඉන්ද්‍රජෝති හිමි 4. පූජ්‍ය වස්කඩුවේ සුභූති හිමි

40. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරටට සිදු වූ අහිතකර බලපෑමක් වන්නේ,
1. කාර්මික විප්ලවයේ බලපෑම මෙරටට ලැබීම
2. ඉංග්‍රීසි භාෂා දැනුම රට තුල පැතිරීම
3. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
4. ඉඩම් අහිමි ජනතාවක් බිහි වීම

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | පැය තුනයි |
|---|---|---|

නම/ විභාග අංකය :- ..........................................................................................................

✶ I කොටසේ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
✶ II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසේ එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
✶ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගෝන නදිය, සෙංකඩගල, මිනිහාගල්කන්ද, දඹකොළපටුන, ත්‍රිකුණාමලය, මින්නේරිය වැව, කෝට්ටේ, ගල් ඔය, සූකරතිත්ථ, මහියංගනය, කල්පිටිය, කතරගම (ලකුණු 12)

(ii) පර්සියන් බොක්ක, මදුරාසිය, කැලිකට්, බ්‍රිතාන්‍යය, සුමාත්‍රා, ඉතාලිය (ලකුණු 06)

(ආ) (i) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික කරුණු හා සම්බන්ධ පුද්ගලයන් සහ ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් සඳහන් කරන්න.


A - ව්‍යවස්ථාදායක සභාවට සීමිත ඡන්දයෙන් පත් වූ ප්‍රථම ලාංකිකයා

B - පොළොන්නරුව අගනුවර කර ගත් ප්‍රථම රජතුමා

C - මහනුවර රාජධානියේ අවසාන සිංහල රජතුමා

D - මැටි බඳුන් නිපදවීමට යොදා ගන්නා යන්ත්‍රය (ලකුණු 04)

(ii) 1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?
3. මෙය කරවූ රජතුමා කවුරුන් ද?
4. මෙහි ඇති විශේෂත්වය කුමක් ද?



(ලකුණු 04)

(iii) 1. B රූපයෙන් දැක්වෙන භික්ෂූන් වහන්සේ කවුරුන් ද?
2. උන්වහන්සේ කිනම් කරුණකට ප්‍රසිද්ධ වූයේ ද?
3. උන්වහන්සේගේ ප්‍රතිවාදීන් කවුරුන් ද?
4. උන්වහන්සේ වැඩ සිටි විහාරස්ථානය කුමක් ද?

B



(ලකුණු 04)

## II කොටස

02\. i. මෙරටින් අතීතයේ දී හමු වී ඇති විදේශීය කාසි අයත් වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා ලියන්න.

(තඹමස්ස, ක්ලෝඩියස් ටොලමි, දීපවංශය, මහාවංශය, කහාපණ, එදා හෙළදිව, ඉන්ඩිකා, ඇරිස්ටෝටල්)

A - මෙරටින් හමු වී ඇති පැරණිත ම කාසි වර්ගය

B - ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් ලියූ කෘතිය

C - ශ්‍රී ලංකාව සිතියමකට නැගූ ප්‍රථම පුද්ගලයා

D - මෙරට ඉතිහාසය අඛණ්ඩ ව ලියවෙන ග්‍රන්ථය (ලකුණු 04)

iii. පූර්ව ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ පරිවර්තනීය ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. අතීතයේ මෙරට සිටි රාජ්‍ය පාලකයින් පොදු ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගාසිටුවීමට කටයුතු කල ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03\. i. පහත සඳහන් A, B හා C ට අයත් ඓතිහාසික තොරතුරු වලට අදාල ස්ථාන නම් කරන්න.

A - තිරුකේතීශ්වරම් හින්දු කෝවිල පිහිටා තිබූ ප්‍රදේශය
B - පැරණි දේවාලයක නටඹුන් හමු වූ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශය
C - තුන්වන විජයබාහු රජු දළදා මැදුර ඉදිකල ප්‍රදේශය (ලකුණු 03)

ii. පහත සඳහන් A, B, C හා D ට අයත් කරුණට අදාල සෙල්ලිපිය වරහන් තුළින් තෝරා ලියන්න.

(අනුරාධපුර පුවරු ලිපිය, හම්බන්තොට මණ්ඩගල සෙල්ලිපිය, බදුලු ටැම් ලිපිය, සිතුල්පව්ව සෙල්ලිපිය, ගොඩවාය සෙල්ලිපිය, කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය, වෙස්සගිරිය සෙල්ලිපිය)

A - නිසි කලට සී සෑම නොකරන අයට කළං පහක දඩයක් නියම කිරීම
B - වෙළෙඳපළක අකටයුතුකම් වැලැක්වීමට නීති පැනවීම
C - උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කිරීම
D - අධිකරණ ශාලාවෙන් ලැබෙන දඩ මුදල් භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සපයා ගැනීමට පූජා කිරීම (ලකුණු 04)

iii. දඹදෙණියේ විසූ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහි වූ දෙවන නාගරීකරණ සමයේ පැවති ආර්ථික ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

04. i. මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් A, B, C හා D ට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(රාජාධිරාජසිංහ රජු, හෙන්රි කුමරු, සේනාසම්මත වික්‍රමබාහු රජු, පර්ඩිනන්ඩ් රජු, ශ්‍රී විජය රාජසිංහ රජු, වස්කෝ ද ගාමා, ලොරෙන්සෝ ද අල්මේදා)

A - ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගන්නා විට උඩරට සිටි රජතුමා
B - නායක්කර් රාජවංශයේ ආරම්භකයා
C - දේශ ගවේෂණයට අනුග්‍රහය දැක් වූ පෘතුගාල පාලකයා
D - ඉන්දියාවි කැලිකට් වලට පැමිණි පළමු පෘතුගීසි නාවිකයා (ලකුණු 04)

iii. නව රාජ වංශයක ආරම්භකයා වූ පළමු වන විමලධර්මසූරිය රජු සිය නිත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ගත් පියවර තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. උඩරට රාජ්‍යයේ බලය ලබා ගැනීමට පෘතුගීසීන් එල්ල කල සියලු ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් හඳුන්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

05. i. පහත සඳහන් A, B හා C ට අදාල පිළිතුරු ලියන්න.

A - උඩරට රාජ්‍යයට පැමිණි පළමු ඉංග්‍රීසි නියෝජිතයා
B - එංගලන්තයේ කිව් මාලිගයේ නැවතී සිටි ඕලන්ද රජතුමා
C - උඩරට යටත් කර ගැනීමට උපායශීලීව කටයුතු කල සිවිල් නිළධාරියා (ලකුණු 03)

ii. ශ්‍රී ලංකාවට පැමිණි ඉංග්‍රීසීන්ගේ අවධානයට ලක් වූ වෙළෙඳ ද්‍රව්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. මියුරන් කොමිසමේ නිර්දේශ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. A - වර්ෂ 1818 ප්‍රථම නිදහස් සටනේ නායකයින් තිදෙනෙකු නම් කරන්න.

B - ඉහත සටනට තුඩුදුන් ආසන්නතම හේතුව හා තවත් එක් හේතුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

06. i. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරටට පැමිණි මිෂනාරී සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් කර ඇති A, B, C හා D ට යන කරුණු වලට අදාල ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහන් කරන්න.

A - ව්‍යවස්ථාදායක සභාවට සීමිත ඡන්ද බලයෙන් නියෝජිතයෙකු පත් කිරීම
B - ප්‍රථම වරට කථානායකවරයෙකු පත් කිරීම
C - දිවයින පළාත් පහකට බෙදීම
D - ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන් පැහැදිළි බහුතරය වීම (ලකුණු 04)

iii. බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ ප්‍රබලයෙකු වූ හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ සේවාවන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. A - හින්දු ආගමික පුනරුදය
B - ඉස්ලාම් ආගමික පුනරුදය
සම්බන්ධයෙන් මූලිකත්වය ගත් වීරවරයන් දෙදෙනෙකුගේ සේවාව උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

07. i. පහත සඳහන් වැවිලි භෝග වල උන්නතිය උදෙසා ආරම්භ කර ඇති පර්යේෂණ ආයතන පිහිටි ප්‍රදේශ පිළිවෙළින් හඳුන්වන්න.

A - තේ B - රබර් C - පොල් (ලකුණු 03)

ii. ශ්‍රී ලංකාවේ බහුල තේ වගා කරන දිස්ත්‍රික්ක හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. කෝල්බෘක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ දෙකක් සඳහන් කර ඉන් එකක් පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

08. i. පුනරුදය නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් නව නිපැයුම් හා සොයා ගැනීම් හා සම්බන්ධ පුද්ගලයන් පිළිවෙලින් හඳුන්වන්න.

A - මුද්‍රණ යන්ත්‍රය නිපද වීම
B - පෘථිවිය ගෝලාකාර බව සොයා ගැනීම
C - දුරේක්ෂය නිපද වීම
D - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම (ලකුණු 04)

iii. පුනරුදය ඇති වීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. යුරෝපයේ ඇති වූ පුනරුදයේ බලපෑම ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න.
(ලකුණු 06)


09. i. බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය හේතුවෙන් මූලික ව්‍යාප්ත වූ කර්මාන්ත තුන සඳහන් කරන්න. (ලකුණු 03)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)


iii. කාර්මික විප්ලවයට සමගාමීව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයට බලපෑ සාධක දෙකක් හඳුන්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. ශ්‍රී ලංකාව කෙරෙහි කාර්මික විප්ලවය බලපෑ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 06)

01. ඇ) i



01. ආ) ii



සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Southern Province

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය 2021**
**Second Term Test**

**11 ශ්‍රේණිය** | **ඉතිහාසය - පිළිතුරු පත්‍රය**

## I - කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **2** | 11 | **1** | 21 | **2** | 31 | **3** |
| 02 | **4** | 12 | **2** | 22 | **1** | 32 | **1** |
| 03 | **1** | 13 | **3** | 23 | **3** | 33 | **2** |
| 04 | **3** | 14 | **3** | 24 | **4** | 34 | **3** |
| 05 | **2** | 15 | **2** | 25 | **2** | 35 | **4** |
| 06 | **4** | 16 | **4** | 26 | **1** | 36 | **2** |
| 07 | **1** | 17 | **1** | 27 | **3** | 37 | **1** |
| 08 | **2** | 18 | **3** | 28 | **4** | 38 | **3** |
| 09 | **4** | 19 | **4** | 29 | **2** | 39 | **2** |
| 10 | **3** | 20 | **4** | 30 | **2** | 40 | **4** |

**(ලකුණු 2 x 40)**

## II කොටස

01. (ආ) (i)
A - පොන්නම්බලම් රාමනාදන් මහතා
B - පළමුවන විජයබාහු රජතුමා
C - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
D - සකපෝරුව **(ලකුණු 1 x 4)**

(ii)
1. ගල්පොත සෙල්ලිපිය
2. පොළොන්නරුව
3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල / නිශ්ශංකමල්ල රජු
4. දිගම සෙල්ලිපිය **(ලකුණු 1 x 4)**

(iii)
1. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
2. පංචමහාවාදය / වාද විවාද
3. මිෂනාරී පූජකවරු
4. කොටහේනේ දීපදුත්තාරාමය **(ලකුණු 1 x 4)**

02. i. චීනය / රෝමය / අරාබිය / ඉන්දියාව **(ලකුණු 1 x 3)**

ii.
A - කහාපණ
B - එදා හෙළදිව
C - ක්ලෝඩියස් ටොලමි
D - මහාවංශය **(ලකුණු 1 x 4)**

iii.
- පිලිස්සූ මැටි වළං භාවිතය
- යකඩ ලෝහ භාවිතය
- කෘෂිකර්මාන්තය ඇරඹීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි
- ස්ථිර ජනාවාස ඉදිකිරීම

**(කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)**

iv.
- බුද්ධදාස / v වන මහින්ද / iv වන කාශ්‍යප / I උපතිස්ස / දුටුගැමුණු වැනි රජවරු
- රෝහල් / උපකරණ / මාතෘ නිවාස ............... වැනි විවිධ පහසුකම්

**(උදාහරණ සහිත කරුණු දෙක විස්තතරයට ලකුණු 6 න් දෙන්න)**

03. i. A - මාතොට / මහාතිත්ථ B - ගල්පාය C - බෙලිගල (ලකුණු 1 x 3)

ii. A - කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය B - බදුලු ටැම් ලිපිය
C - අනුරාධපුර පුවරු ලිපිය D - සිතුල්පව්ව සෙල්ලිපිය (ලකුණු 1 x 4)

iii. - උගත් පඬිවරයෙකු වීම උදා: කව්සිළුමිණ
- චන්ද්‍රභානුගේ I / II ආක්‍රමණ හා කාලිංග මාඝ පැරදවීම
- සාහිත්‍ය හා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම
- රට දියුණු කිරීම **(කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)**

iv. - වී වගාව / හේන් වගාව ප්‍රධාන වීම හා වර්ෂා ජලය යොදා ගැනීම
- වෙළඳ භෝග හා ද්‍රව්‍ය අපනයනය උදා:................
- විදේශ රටවල් සමග වෙළඳ සබඳතා උදා:..............
- අභ්‍යන්තර වෙළඳාම දියුණු කිරීම උදා:...................
**(කරුණු දෙක උදාහරණ සහිත විස්තර කිරීම ලකුණු 6 න් දෙන්න)**

04. i. සෙංකඩගල නුවර / උඩරට රාජධානිය / කන්දේ නුවර ............... (ලකුණු 1 x 3)

ii. A - රාජාධිරාජසිංහ රජු B - ශ්‍රී විජය රාජසිංහ රජු
C - හෙන්රි කුමරු D - වස්කෝ ද ගාමා (ලකුණු 1 x 4)

iii. - උඩරට රාජධානියේ නීත්‍යානුකූල උරුමය හිමි වූ කුසුමාසන දේවිය විවාහ කර ගැනීම
- කතෝලික ආගම අතහැර බුදු දහම වැළඳ ගැනීම
- විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබා ගැනීම
- දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව මහනුවරට වැඩම කිරීම
**(පියවර 03 ට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි)**

iv. - උඩරට ජනතාව රාජපාක්ෂික වීම
- පෘතුගීසීන් විසින් සටන් කිරීමට ගිය පහතරැටියන් (ලැස්කිරිඤ්ඤා) උඩරට දී රජුට එකතු වීම
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශලය්‍ය
- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම
**(කරුණු 03 ට ලකුණු 03 යි. විස්තර කිරීමට ලකුණු 03 යි)**

05. i. A - ජෝන් පයිබස් B - පස්චන විලියම් C - ජෝන් ඩොයිලි (ලකුණු 1 x 3)

ii. කුරුඳු / ගම්මිරිස් / එනසාල් / කරාබුනැටි / මුතු / මැණික් / ඇත්දල / කැස්බෑ කටු
(ලකුණු 1 x 4)

iii. - බදු එකතු කිරීමට යොදවා සිටි මදුරාසි නිලධාරීන් ආපසු යවා ඒ සඳහා දේශීය නිලධාරීන් යොදවා ගැනීම (අවුම්ල්දාර්වරු)
- පොල් ගස් බද්ද ඇතුලු අලුත් බදු වර්ග ඉවත් කිරීම
- ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිළධාරීන් පත් කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටු වීම **(කරුණු 03 ට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි)**

iv. A - මොණරවිල කැප්පෙටිපොල / මඩුගල්ලේ දිසාව / බූටෑවේ රටේරාල / කිවුලෙ ගෙදර මොහොට්ටාල ................. (ලකුණු 1 x 3)

B - මඩිගෙ මුහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් පත් කිරීම ඇතුලු තවත් හේතුවක් කෙටි විස්තරයට (ලකුණු 03)

06. i. ලන්ඩන් මිෂනාරී / බැප්ටිස්ට් මිෂනාරී / වෙස්ලියන් මිෂනාරී / ඇමරිකන් මිෂනාරී / චර්ච් මිෂනාරී
(ලකුණු 1 x 3)

ii. A - කෲව් මැකලම් B - ඩොනමෝර්
C - කෝල්බෲක් D - මැනිං ඩොවෙන්ෂර් (ලකුණු 1 x 4)

iii. - පරම විඥානාර්ථ සමාගම පිහිටු වීම - බෞද්ධ පාසල් ඇරඹීම උදා: ................
- ඉරුදින දහම් පාසල් ඇරඹීම - වෙසක් පෝය රජයේ නිවාඩු දිනයක් කිරීම
- බෞද්ධ කොඩිය නිර්මාණය **(කරුණු 02 ට සහ විස්තරයට ලකුණු 05 න් දෙන්න)**

iv. A - ආරුමුග නාවලර් / පොන්නම්බලම් රාමනාදන් ගේ සේවාව
B - සිද්ධි ලෙබ්බේ/ ටී.බී.ජයා ගේ සේවාව **(කරුණු අනුව විස්තරයට ලකුණු 06 න් දෙන්න)**

07. i. A - තලවකැලේ B - අගලවත්ත C - ලුණුවිල **(ලකුණු 1 x 3)**

ii. නුවරඑළිය /මහනුවර / බදුල්ල / මාතලේ /රත්නපුරය /මාතර /ගාල්ල **(ලකුණු 1 x 4)**

iii. - වතු වගාව සඳහා රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
- අනිවාර්ය සේවා රාජකාරී ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම
- රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
- ඉඩම් වලින් බදු අය කිරීම
- ඉතිරි කිරීමේ බැංකුවක් ඇරඹීම **(කරුණු 02 හා විස්තරයට ලකුණු 5 න් දෙන්න)**

iv. - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටු වීම - සර්වජන ඡන්ද බලය
- විධායක කාරක සභා - ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිළධාරීන්
**(ලක්ෂණ 02 විස්තර කිරීමට ලකුණු 06 න් දෙන්න)**

## <u>III කොටස</u>

08. i. වැනීසිය / ජිනෝවා / ප්ලෝරන්ස් **(ලකුණු 1 x 3)**

ii. A - ජොහැන්නස් ගුටන්බර්ග් B - නිකලස් කොපර්නිකස්
C - ගැලීලියෝ ගැලිලි D - අයිසෙක් නිව්ටන් **(ලකුණු 1 x 4)**

iii. - කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම
- වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහි වීම
- බුද්ධි ප්‍රබෝධය
- පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම **(කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)**

iv. - බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම / පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ලැබීම
- වතු වගාව / ආනයන අපනයන ආර්ථිකය
- මහා මාර්ග / දුම්රිය මාර්ග / ආගම් ප්‍රචාරය /මුද්‍රණ කර්මාන්තය .....................
**(කරුණු දෙක විස්තර කිරීම අනුව ලකුණු 06 න් දෙන්න)**


09. i. පේෂ / ගල් අගුරු / යකඩ හා වානේ

ii. - කර්මාන්තය සඳහා මුදල් අයෝජනය කිරීමට ධනවතුන් සිටීම
- ජනගහනය අධික වීම හා භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩි වීම
- පුනරුදය නිසා යන්ත්‍ර සූත්‍ර නිපදවීම
- යකඩ හා වානේ / ගල් අගුරු සොයා ගැනීම **(ලකුණු 2 x 2)**

iii. - මහා පරිමාණ ගොවි බිම් ඇරඹීම (ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය)
- ශෂ්‍ය මාරු ක්‍රමය
- සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම
- නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතය
- ගුවානෝ පොහොර නිපදවීම **(කරුණු 02 ට ලකුණු 02 යි. විස්තරයට ලකුණු 03 යි)**

iv. - වතු වගාව ආශ්‍රිත කර්මාන්තශාලා හා යන්ත්‍ර සූත්‍ර භාවිතය
- මහා මාර්ග / දුම්රිය මාර්ග / යකඩ පාලම් ඉදි වීම
- වෙළඳ නගර බිහි වීම
- තැපැල් / ටෙලිග්‍රාප් සේවාව ඇරඹීම **(කරුණු දෙක විස්තර කිරීමට ලකුණු 06 න් දෙන්න)**

01. ඇ) i




01. ආ) ii

